**පේදුරුතුඩුව නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 15 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 30 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදි මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිකරනු ලැබූ ගොඩනැගිලි 10ක වටිනාකම රු.7,499,716ක් ගොඩනැගිලි ගිණුමට ඇතුළත් නොකිරීම නිසා මුළු වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | රු.7,499,716ක් වත්කම් ගිණුමට එකතු කිරීමට කටයුතු කර ඇත. | ගොඩනැගිලි සියල්ල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාහනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා මූල්‍ය රීති මාලාව | | | |
| | (I) III පරිච්ඡේදයේ 54(2) වගන්තිය | හිඟ කුලී ගාස්තු රු.1,119,899ක් අයකර නොතිබුණි. | හිඟ මුදල් නොගෙවූ පදිංචිකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන ඇත. | නියමිත මූල්‍ය රීති ප්‍රකාරව කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. |
| | (II) III පරිච්ඡේදයේ 54 (3) වගන්තිය | හිඟ වරිපනම් බදු රු.15,419,137 ක් ගෙවීම පැහැර හැරී අයට වරෙන්තු නිකුත් කර නොතිබුණි. | වරිපනම් බදු නොගෙවූ බදු හිමියෙකු සඳහා වරෙන්තු නිකුත් කර තිබුණි. | නියමිත කාලයේ නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව සුදුසු කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත් ඇප මුදල් තැන්පතු රු. 102,627ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇප මුදල් ගෙවීමට කටයුතු කර ඇත. | කොන්ත්‍රාත් ආරක්ෂිත ඇප තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත ක්‍රියාමාර්ග යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,559,171 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 61,748,113 ක් විය. පසුගිය වර්ෂය සමග සැසඳීමේදි ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 31,188,942 කින් පිරිහී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,874,380 | 11,260,969 | 15,419,137 | 6,025,000 | 6,714,819 | 7,344,186 |
| කුලී | 10,521,300 | 10,500,540 | 1,313,824 | 10,600,000 | 9,897,279 | 1,281,268 |
| බලපත්‍ර ගාස්තු | 634,000 | 863,090 | - | 572,000 | 691,215 | - |
| වෙනත් ආදායම් | 82,280,500 | 63,180,467 | 7,312,266 | 76,088,000 | 39,259,210 | 42,322,867 |
| එකතුව | 103,310,180 | 85,805,075 | 24,645,227 | 93,285,000 | 56,562,523 | 50,948,321 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ හිඟ දේපල බදු රු. 13,973,055 ක් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ දේපල බදු නොගෙවූ බදු හිමියන්ට වරෙන්තු නිකුත් කිරිමට කටයුතු කර තිබුණි. | හිඟ දේපල බදු අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 2.2.3 වෙළෙඳ බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.71,296 ක් වටිනා දැන්වීම් පුවරු ස්ථාපිත කර තිබුණත් ඒ සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ඉතිරි මුදල් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ දැන්වීම් පුවරු බලපත්‍ර ගාස්තු අයකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 2.2.4 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.3,955,490 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ මුද්දර ගාස්තු නියමිත කාලයේදි අයකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සෞඛ්‍යය, පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 15 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කර තිබුණි. | අදාල ක්‍රියාමාර්ග ගනිමින් පවති. | අදාළ ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෞඛ්‍ය කම්කරුවන්ට සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් කිසිවක් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන් 10දෙනෙකුට අදාල පූර්ණ වෛද්‍ය වාර්තා අප වෙත ලැබී ඇත. | නියමිත කාලයේ කම්කරුවන් සඳහා වෛද්‍ය පරීක්ෂණයන් සිදුකළ යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් නොකිරීමෙන් නගර සභාවට අයත් වැදගත් කාර්යයක් ඉටු නොවී පැවතුණි. | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු 2020 වර්ෂයට අදාල ක්‍රියාකාරි සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම ආදිය සකස් කර නියමිත කාලපරිච්ඡේදයේ ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ. | වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | අප විසින් අපේක්ෂා කර ලබාදෙන කාල පරාසයට වඩා වැඩි කාලයක් අවශ්‍යව පැවතුණි. එමනිසා එවැනි කාල පරාසයන් වෙනස් කළ යුතුව ඇත. | ජනතාවට සැලසිය යුතු සේවාවන් නියමිත කාලයේ සැලසීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සභාව විසින් නගර සභාවේ බල ප්‍රදේශයට අයත් ප්‍රදේශ සංවර්ධනය කිරීමේ පරමාර්ථ සඳහා උපයෝජනය නොකර ස්ථාවර තැන්පත් ලෙස රු.210,987,678 ක් වටිනා අරමුදල් නගර සභාව විසින් පවත්වාගෙන තිබුණි. | අයවැය සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කරමින් පවති. | සභාවට අයත් අරමුදල් නියමිත කාලයේ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | රු.253,454ක් වටිනා උපකරණ ලීබඩු හා සවිකිරීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකර තොග ගිණුමේ ඇතුළත් කිරිම හේතුවෙන් එම වටිනාකමින් තොගය වැඩියෙන් දැක්වුණි. | ප්ලාස්ටික්වලින් සමන්විත කුඩා කඩයක් (Fiber Glass Sale Outlet) තොග ලේඛනයෙන් ඉවත් කර උපකරණ ලේඛනයේ 20 පිටුවෙහි 2020 වර්ෂයේ මාරුකර ඇත. | වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන නොයෙදවීම නිසා, එවැනි මානව සම්පත් 20 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා සභාව විසින් ලිපි යවනු ලැබ ඇත. අනුමැතිය ලැබූ විගස තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේදී පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2019 වර්ෂයේ දේපල 3,804 ක් සඳහා "K" ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | K ආකෘති පත්‍ර ලබාදිය යුතු බදුහිමියන් විදේශගතව පදිංචිව සිටින නිසා ඍජුව භාරදිය නොහැකි වී ඇත. | හිඟ දේපල බදු අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග නියමිත කාලයේදි ගත යුතු වේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වතුර බවුසරයත්, රෝද දෙකේ ට්‍රැක්ටරයත් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. | වාහන සඳහා නඩත්තු හා අලුත්වැඩියාවන් අදාළ කාලවලදී සිදුකළ යුතු වේ. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ඉඩම් කොටස් 10 ක් සභාවේ නමට පවරා ගෙන නොතිබුණි. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කරමින් පවතී. | ඉඩම් සඳහා අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | රු.212,226,468ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉඩම් හිමිකම් ඔප්පු ලබාගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා අයිතිය මාරු කිරීමට නියමිත කාලයේදි කටයුතු කළ යුතු වේ. |

### 3.5.3 නිෂ්කාර්ය වත්කම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වතුර බවුසරයක් මුළුමනින්ම මලකඩ බැදී නිෂ්කාර්යව පැවතුණු නමුත් මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වතුර බවුසරය වෙන්දේසියේ විකිණීමට කිරීමට කටයුතු කර ඇත. | භාවිතා කළ නොහැකි වාහන ඉවත් කිරීමට අදාළ කාලය තුළ කටයුතු සිදු කළ යුතු වේ. |
| (ආ) | නගර සභාව විසින් ඉදිකළ කඩ කාමර 07ක් මේ දක්වා කුලියට ලබා දී නොතිබුණි. | කඩකාමර 07ම විෂබීජහරණය කිරීමට පහසු ආකාරයෙන් අයිතමයන් ගබඩාගත කිරීමට භාවිතා කරමින් පවතී. | කඩකාමර කුලියට දිමට සුදුසු ක්‍රියාමාර්ග නියමිත කාලය තුළ සිදුකළ යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම නිසා මෙය ඵලදායී නොවූ අයවැයක් ලෙස දක්නට ලැබුණි. | පුරප්පාඩුව පවතින කාර්ය මණ්ඩල වැටුප් 2019 වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබුණත් පුරප්පාඩු පුරවා නොතිබුණි. අපේක්ෂා කළ ගමන් වියදම් සිදු නොවිය. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |